කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

විෂය- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සංග්‍රහය

ශ්‍රේණිය - 11

සකස් කළ ගුරුභවතාගේ නම - ආර්.ජී.එච්.ආර්.රාජපක්ෂ මිය

පාසල - ර/ මිහිඳු විද්‍යාලය

පාඩම - 02. කළමණාකරණය

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) ව්‍යාපාර කළමණාකරු, විකුණුම් ප්‍රමාණය 50% කින් වැඩි කර ලාභ ඉපයීමට අපේක්ෂා කරයි. මෙය අයත් කළමණාකරණ කාර්යය වන්නේ,
   i) සැලසුම්කරණය
   ii) සංවිධානකරණය
   iii) මෙහෙයවීම
   iv) පාලනය
2) ව්‍යාපාරයක් විසින් ඒ ඒ අංශ සඳහා කළමණාකරුවන් පත් කිරීම හා සේවකයන්ට අවශ්‍ය සම්පත් ලබා දීම යන කාර්යයන් අයත් වන්නේ,
   i) සැලසුම්කරණය
   ii) සංවිධානකරණය
   iii) මෙහෙයවීම
   iv) පාලනය
3) සම්පත් අපතේ යාමකින් තොරව අවම පිරිවැයකින් පරිහරණය කිරීම හඳුන්වන්නේ,
   i) කාර්යක්ෂමතාව
   ii) සංවිධානකරණය
   iii) සඵලතාවය
   iv) පාලනය
4) නායකත්වය, අභිප්‍රේරණය හා සන්නිවේදනය යන කාර්යයන් කළමණාකරණ ක්‍රියාවලියේ කුමන කාර්යයට අයත් වේද?
   i) සැලසුම්කරණය
   ii) සංවිධානකරණය
   iii) මෙහෙයවීම
   iv) පාලනය
5) කළමණාකරණය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i) කළමණාකරුවන් විසින් සේවකයන් කළ යුතු කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම හා ඔවුන් එම කාර්යයන්ට යොමු කිරීම සංවිධානකරණයයි.
   ii) ව්‍යාපරයක අරමුණු තීරණය කිරීම හා එම අරමුණු ඉටු කර ගැනීමේ ක්‍රම තීරණය කිරීම සැලසුම්කරණයයි.
   iii) සැලසුම් කරන ලද අරමුණු ක්‍රියාත්නක කිරීමේදී ව්‍යාපාරයේ මානව සම්පත් නිසි ලෙස හැසිරවීම පාලනයයි.
   iv) සැලසුම් කළ පරිදි ගුණත්වයෙන් යුතු භාණ්ඩ නිෂ්පාදනය කර ඇත්දැයි සොය බැලීම මෙහෙයවීමයි.

6) යහපත් වෘත්තීය සම්බන්ධතා පවත්වා ගැනීම තුළින් සේවකයන් තම කාරයයන් නිසි ලෙස ඉටු කිරීමට පෙළඹ වීම,
   i) සැලසුම්කරණයයි.
   ii) සංවිධානකරණයයි
   iii) මෙහෙයවීමයි
   iv) පාලනයයි
7) තම පාසලේ වාණිජ දිනය සඳහා තොරතුරු, සම්පත් හා වැඩ බෙදාහැරීම වාණිජ විෂයය භාර ගුරුවරයා විසින් සිදු කරන ලදී.මෙය අයත් වන කළමණාකරණ කාර්යය වන්නේ,
   i) සංවිධානකරණය
   ii) මෙහෙයවීම
   iii) සැලසුම්කරණය
   iv) පාලනය
8) සැලසුම්කරණය යනු,
   i) අතීතය සඳහා වූ ක්‍රියාවලියකි.
   ii) වර්තමානය සඳහා වූ ක්‍රියාවලියකි.
   iii) අනාගතය සඳහා වූ ක්‍රියාවලියකි.
   iv) අතීත අත්දැකීම් පදනම් කර ගෙන වර්තමාන ගැටළු විසඳීම සඳහා අදාළ වැඩපිළිවෙළකි.
9) සැලසුම්කරණයට අදාළ කාර්යයක් නොවන්නේ,
   i) අරමුණු ස්ථාපනය
   ii) උපාය මාර්ග තීරණය කිරීම
   iii) ප්‍රතිපත්ති සැකසීම
   iv) මූල්‍ය පරිපාලනය
10) ව්‍යාපාර අරමුණු අපෙක්ෂිත අයුරින් ඉටු කර ගැනීම,
   i) කාර්යක්ෂමතාවය යි.
   ii) ඵලදායිතාවය යි
   iii) කළමණාකරණය යි.
   iv) සඵලදායකත්වය යි.

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 1 | 6 | 3 |
| 2 | 2 | 7 | 2 |
| 3 | 1 | 8 | 3 |
| 4 | 3 | 9 | 4 |
| 5 | 2 | 10 | 4 |